**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

**කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණ)** - MM 1.1 (II ශ්‍රේණිය) :

රැකියා විස්තරය : විෂයානුබද්ධ දේශන පැවැත්වීම, විෂය ක්ෂේත්‍රයට අදාළ කර්මාන්තයේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම සහ ඇගයීම, විෂය ක්ෂේත්‍රයට අදළ වැඩසටහන්/පාඨමාලා සකස් කිරීම සහ සංවර්ධනය කිරීම, විෂය ක්ෂේත්‍රය සඳහා සුදුසු පුහුණු වැඩසටහන්/පාඨමාලා සැලසුම් කිරීම සහ පැවැත්වීම, පුහුණු පාඨමාලාවල ඵලදායිතාව තක්සේරු කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ ශිල්පීය ක්‍රම සංවර්ධනය කිරීම, ආයතනයේ පාඨමාලා/වැඩසටහන්වල කළමනාකරණ නිපුණතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම.

සුදුසුකම් : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය, කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණය, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, වැවිලි බෝග තාක්ෂණය (කෘෂි ආර්ථික විශේෂිත) යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් සහ උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළ ව අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්ද.

වැටුප : රු. 53,175 හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ.

වයස් සීමාව : වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

2. **සහකාර අධ්‍යක්ෂ (අලෙවි, ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්) තනතුර** - MM 1.1 (II ශ්‍රේණිය) :

රැකියා විස්තරය : පුහුණු වැඩසටහන්/පාඨමාලා සහ අනෙකුත් සේවාවන්හි ප්‍රවර්ධනය සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම, වෙළඳපළ පර්යේෂණ අධ්‍යයන ආරම්භ කිරීම සහ කර්මාන්තයේ පාරිභෝගික සහ වෙළඳපළ අවස්ථා අවබෝධ කර ගැනීම සඳහා රැකියා වෙළඳපොළ විශ්ලේෂණය කිරීම, සමකාලීන අවශ්‍යතා හඳුනා



ගැනීම මගින් වැඩසටහන්/පාඨමාලා සංවර්ධනය කිරීමට කළමනාකරණයට සහාය වීම. සේවාලාභීන්ට පුහුණු වැඩසටහන්/පාඨමාලා හෝ සේවා සන්නිවේදනය කිරීම, පාර්ශවකරුවන් අතර වෘත්තීය නිපුණතාව පවත්වා ගැනීම, වෘත්තීය නිපුණතාව පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා වෘත්තීය රැස්වීම්, අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ උපදේශක පුහුණු වැඩමුළුවලට සහභාගී වීම, ව්‍යාපාර සැලසුම් විශ්ලේෂණය සහ සංවර්ධනය කිරීම, අලෙවිකරණය උපායමාර්ගික සහ ආයතනික සැලසුම්, ව්‍යාපෘති සැලසුම්, පුරෝකථන, අයවැය, මූල්‍ය සහ කාලසටහන් ප්‍රකාශ ඇතුළු සැලසුම් සහ විකුණුම් සහ අලෙවි අරමුණු ස්ථාවර පදනමක් මත සාක්ෂාත් කර ගැනීම සඳහා ඉල්ලුම මත පදනම් වූ වැඩසටහන්වලට ප්‍රමුඛත්වය දීම, අධ්‍යයන හා පුහුණු බලපෑම් ඇගයීම් පැවැත්වීම, ප්‍රකාශන, ක්‍රියාකාරී සැලැස්ම, පුහුණු අයවැය සකස් කිරීම, වාර්ෂික වාර්තාව සඳහා කාර්ය සාධන සමාලෝචන වාර්තාව සහ පුහුණු සංරචක, ආයතනයේ ප්‍රාදේශීය අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය සහ අනෙකුත් අධ්‍යයන ආශ්‍රිත ක්‍රියාකාරකම් හා සම්බන්ධ බාහිර සංවිධාන සමග සම්බන්ධතා පැවැත්වීම

සුදුසුකම් : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අලෙවි කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍යය යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් සහ උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව පිළිගත් රාජ්‍ය/සංස්ථා/මණ්ඩල/රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්ද.

වැටුප : රු. 53,175 හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ.

වයස් සීමාව : වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

3. **පුහුණු කිරීමේ නිලධාරි (වැවිලි ඉංජිනේරු)** - JM 1.1 (II ශ්‍රේණිය) :

රැකියා විස්තරය : විෂයානුබද්ධ දේශන පැවැත්වීම, පුහුණු විශේෂඥයින්ට පැවරී ඇති රාජකාරි ඉටු කිරීමට පුහුණු විශේෂඥයින්ට

සහාය වීම, පුහුණු විශේෂඥයින්ගේ මගපෙන්වීම යටතේ පුහුණු පාඨමාලා සහ අදාළ අත්පොත් සැලසුම් කිරීම, කර්මාන්තය සඳහා සුදුසු පුහුණු වැඩසටහන්/පාඨමාලා සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම, අධ්‍යයන බලපෑම ඇගයීම සහ පුහුණු වැඩසටහන්/පාඨමාලා, ඇගයීම් වාර්තා සකස් කිරීම, මූල්‍ය ලාභ සහ අනෙකුත් අදාළ සංඛ්‍යාලේඛන සහ පුහුණු විශේෂඥයින්/කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කිරීම.

| | | |
|---|---|---|
| සුදුසුකම් | : | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් වැවිලි ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය (කෘෂි විද්‍යාව විශේෂිත), කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණය, වැවිලි බෝග තාක්ෂණය (වැවිලි ඉංජිනේරු විද්‍යාව විශේෂිත) යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම |
| වැටුප | : | රු. 42,600/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ. |
| වයස් සීමාව | : | වයස අවුරුදු 22 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | : | ලිඛිත තරගකාරි විභාගයක් සහ/ හෝ වෘත්තීයවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| පොදු කරුණු | : | ඉහත සියලුම තනතුරු සඳහා අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පොදු පරිගණක යෙදවුම් හැසිරවීම පිළිබඳ දැනුම තිබිය යුතු ය.<br><br>උක්ත තනතුරු සඳහා තේරී පත්වන අයදුම්කරුවන් අදළ රාජකාරි කටයුතු නිසි ලෙස ඉටු කිරීම සඳහා කායිකව මෙන්ම මානසිකව ද යෝග්‍ය විය යුතු අතර සේවා අවශ්‍යතාව මත ප්‍රධාන කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කටයුතු සිදු කිරීමට බැඳී සිටිය යුතු ය. |

**වෙනත් ප්‍රතිලාභ**

- සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් මූලික වැටුපෙන් 12% ක හා 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.
(සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය මූලික වැටුපෙන් 10% කි)
- ආසන්නම නගර සඳහා ප්‍රවාහන පහසුකම් (කඩුවෙල/කොට්ටාව)

14

**අයදුම් කරන පිළිවෙල :**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, අදාළ සහතිකවල පිටපත් සහිත ව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2023 දෙසැම්බර් මස 18 වන දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයැදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. කිනම් තත්ත්වයක් යටතේ වුව ද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නො ලැබේ.

**සැලකිය යුතුයි :**

- වඩාත්ම සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.
- මෙම දැන්වීම www.nipm.gov.lk යන වෙබ් අඩවියේ ද පළකොට ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.
දුරකථනය : 011-2770232

12-332/2